# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 39 දරන විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වූ කෝසල දුල්ලෑව පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ජූලි මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 5.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2009 අංක 39 දරන විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වූ කෝසල දුල්ලෑව පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 ජූලි මස 24 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 15/2006.

### විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වූ කෝසල දුල්ලෑව පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

“විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වූ කෝසල දුල්ලෑව පදනම ” යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන සංගමයක්, ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, එකී පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබ හා ඉටු කරනු ලැබ ඇති හෙයින් ද, ඒ සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින්, ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 39 දරන විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වූ කෝසල දුල්ලෑව පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දින සිට හා ඉන්පසුව (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වූ කෝසල දුල්ලෑව පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන්, ( මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වූ කෝසල විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා වූ කෝසල දුල්ලෑව පදනම සංස්ථාගත කිරීම.

2-PL 003159 -2,750 (2008/08)

දුල්ලෑව පදනම"යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තවද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශාරීරික හා මානසික දුබලතා ඇති, අඩු වරප්‍රසාද ලත් දරුවන්ට සමාජයට සහ රටට යම් දායකත්වයක් ලබාදීමට හැකිවන පරිදි ඔවුන්ගේ කුලය, වර්ගය, ජාතිය හෝ ආගම නොතකා ආධාර කිරීම ;

(ආ) වයස අවුරුදු විසි පහ දක්වා වනතෙක් දුබලතා ඇති දරුවන් සහ වැඩිහිටි තරුණයන්ගේ සුභසාධනය සඳහා උපකාර කිරීම;

(ඇ) දුබලතා ඇති දරුවන්ගේ නිපුනතා වර්ධනය කිරීමට සහ ස්වාධීනව කටයුතු කිරීමට ඔවුන්ව දිරිමත් කිරීම උදෙසා සම්මන්ත්‍රණ, රැස්වීම්, පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීම සහ සංවිධානය කිරීම ;

(ඈ) තමන්ට සහ වෙනත් අයට අනතුරක් නොවන පරිදි තම හැකියාවන්, සහ නොහැකියාවන් සහ සීමාවන් පිළිබඳව දුබලතා ඇති දරුවන්ට ඉගැන්වීම සහ ඔවුන් දැනුවත් කිරීම ;

(ඉ) ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම සහ ශාරීරික හා මානසික වශයෙන් දුබලතා ඇති තරුණයන්ව වෘත්තීය පුහුණු වැඩ සටහන්වල නියුක්ත කරවීම ;

(ඊ) රටේ සංවර්ධනය උදෙසා දුබලතා ඇති දරුවන්ගේ දායකත්වය පිළිබඳව එම දරුවන්ගේ දෙමාපියන් සහ පවුලේ සාමාජිකයන් අතර සහ පොදුවේ මහජනතාව අතර දැනුවත් කිරීමක් ඇති කිරීම ;

(උ) දුබලතා ඇති දරුවන්ට සහ සංස්ථාවේ පරමාර්ථ හා සමාන අරමුණු ඇති වෙනත් සංවිධානවලට පරිත්‍යාග, ආධාර සහ රැකවරණය ලබාදීම ;

(ඌ) දුබලතා ඇති දරුවන්ගේ යහපත උදෙසා ශ්‍රී ලංකාවේ ඕනෑම කොටසක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ;

(එ) ශ්‍රී ලංකාවේ හෝ පිටරටක දී පදනමට සමාන අරමුණු ඇති වෙනත් සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා සංස්ථාව විසින් අනුමත කරනු ලබන කවර හෝ දරුවකු සංස්ථාවේ වියදමින් ශ්‍රී ලංකාවේ හෝ පිටරට පුහුණු කිරීම, හෝ පුහුණු කිරීමට සැළැස්වීම ;

(ඔ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන, ප්‍රදර්ශන සහ වෙනත් වැඩසටහන් සහ කටයුතු ආරම්භ කිරීම, සංවිධානය කිරීම සහ පැවැත්වීම ;

(ඕ) ශ්‍රී ලංකාව තුල හෝ පිටරට, දුබලතා ඇති දරුවන් ක්‍රීඩා උත්සවවලට පුහුණු කරවීම සහ එවැනි උත්සව සංවිධානය කිරීම ;

(ක) දුබලතා ඇති දරුවන් සඳහා විනෝදවීමේ උත්සව සංවිධානය කිරීම ;

(ග) දුබලතා ඇති තැනැත්තන්ගේ අයිතිවාසිකම් වැඩිදියුණු කිරීම සඳහා අදාළ බලධාරීන් වෙත නීති ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කිරීම ;

(ච) සංස්ථාවේ වියදමින් දුබලතා ඇති දරුවන් වෙනුවෙන් භාරකරුවන් හෝ රැකවලුන් පත් කිරීම සඳහා අවශ්‍ය නඩු කටයුතු පැවරීම ; සහ

(ජ) දුබලතා ඇති දරුවන් සඳහා පොත් සාප්පු සහ පුස්තකාල පිහිටුවීම ;

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම, සහ පරිපාලනය කිරීම මේ පනතේ විධිවිධාන හා 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව එම රීතිවල විධිවිධාන සළස්වා ඇති පරිදි සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වූ ද, ඒ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන්නා වූ ද, කළමනාකරණ මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරතුව වූ දිනයේ ධුර දරන සංගමයේ විධායක සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු අතර, ඔවුන් සංස්ථාවේ රීති යටතේ නව කළමනාකරණ මණ්ඩලයක් තෝරා පත්කර ගන්නා තෙක් ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** සංස්ථාවේ රීතිවලට යටත්ව බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම හෝ එකතු කිරීම, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහ කිරීම ඇතුළුව, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට තිබිය යුතු ය.

ගිණුම් විගණනය කිරීම.

**6.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාවට ලැබෙන ආදයම් හි වියදම් සහ වත්කම් හා බැරකම් පිළිබඳවත්, අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳවත් නිසි ගිණුම් පවත්වාගෙන යාමට, සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාව විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින්, සංස්ථාවේ ගිණුම් වාර්ෂිකව විගණනය කළ යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන්

වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

7. (1) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම සම්බන්ධයෙන් ද, නිලතල දරන්නන් තෝරාපත් කර ගැනීම සඳහා ද, සංස්ථාවේ නිලතල දරන්නන්ගේ නියෝජිතයන්ගේ, නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටුකිරීම සඳහා ද, සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් සහ පොදුවේ සංස්ථාවේ කටයුතු කළමණාකරනය කිරීම සඳහා සහ එහි අරමුණු ඉටුකර ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල වාර්ෂික මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය. එසේ සාදනු ලබන රීති එවැනිම රැස්වීමක දී ඒ හා සමාන ආකාරයෙන්ම වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය. සංස්ථාවේ රීති.

(2) සංස්ථාවේ සෑම සාමාජිකයෙක්ම සංස්ථාවේ නීති රීතිවලට යටත් විය යුතු ය.

8. සංස්ථාවේ ආදායම් සහ දේපළ මෙහි දක්වා ඇති සංස්ථාවේ අරමුණුවල ප්‍රවර්ධනය සඳහා පමණක් යොදා ගත යුතු අතර, එහි යම් කොටසක්, ලාභාංශයක්, ණයක්, ප්‍රසාද දීමනාවක් හෝ ලාභයක් අන්‍යාකාරයකට සෘජුව හෝ වක්‍රව සංස්ථාවේ සාමාජිකයන්ට ගෙවීම හෝ පැවරීම නොකල යුතු ය. සංස්ථාවේ ආදායම හා දේපළ අදාළ කර ගැනීම.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මත හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කර දෙනු ලබන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙහිලා හැකියාව හා ශක්තතාව තිබිය යුතු අතර, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත් ව ඒ සියලු දේපළ විකිණීමේ , උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ, හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**පදනමෙන් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.**

10. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදින වන විට පදනමට අයවිය යුතු සාමාජික මුදල්, ගාස්තු, දායක මුදල් ඇතුළු සියලු ණය මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

11. සංස්ථාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම් අත්සන් කළ යුතු ය. තවද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

**සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.**

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි ණය සහ බැරකම් ගෙවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරිව ඇතිනම්, එම දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු නමුත්, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සහ එහි යම් ආදායමක් හෝ දෙපළක් එහි සාමාජිකයන් අතර බෙදාදීම රීති මගින් තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ලබාදීම හෝ මාරු කිරීම කළ යුතු ය. එම ආයතනය හෝ ආයතන, සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

13. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

14. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.